**2026-02-09 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල
රැස්වීමේදී එළඹුණු තීරණ**

**01. ග්‍රාහක සිම් කාඩ්පත් (ග්‍රාහක අනන්‍යතා මොඩියුල - SIM) ලියාපදිංචි කිරීමේ රෙගුලාසි සංශෝධනය කිරීම සහ 2019-08-02 දිනට පෙර ලබා ගන්නා ලද සිම් කාඩ්පත්වලට අදාළ ග්‍රාහක තොරතුරු නැවත ලියාපදිංචි කිරීම**

1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ විධිවිධාන අනුව 2019 අංක 01 දරන ග්‍රාහක සිම් කාඩ්පත් (ග්‍රාහක අනන්‍යතා මොඩියුල - SIM) ලියාපදිංචි කිරීමේ රෙගුලාසි 2019-08-02 දිනැති ව ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අතර, එකී රෙගුලාසි එදිනෙන් පසුව නිකුත් කරන ලද සිම් කාඩ්පත් සඳහා පමණක් අදාළ වේ. එබැවින්, 2019-08-02 දිනට පෙර ලියාපදිංචි වූ ඇතැම් ග්‍රාහකයින් පිළිබඳ තොරතුරු දූරකථන ක්‍රියාකරු සමාගම් සතුව නොමැති අතර, ඒ හේතුවෙන් ඇතැම් නීති විමර්ශන කටයුතුවලදී ගැටලු සහගත තත්ත්වයක් නිර්මාණය වී තිබේ. එමෙන්ම, වයස අවුරුදු 16 - 17 අතර ග්‍රාහකයින් ලියාපදිංචි කිරීමට සහ මෙරටට පැමිණෙන විදේශිකයින්ට සිම් කාඩ්පත් නිකුත් කිරීමට අදාළ නව විධිවිධාන ද ඇතුළත් කරමින් දැනට ක්‍රියාත්මකව පවතින රෙගුලාසි වර්තමාන අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි සංශෝධනය කිරීමේ අවශ්‍යතාව ද හඳුනාගනු ලැබ තිබේ. ඒ අනුව, 2019-08-02 දිනට පෙර ලබා ගන්නා ලද සිම් කාඩ්පත්වලට අදාළ ග්‍රාහක තොරතුරු නැවත ලියාපදිංචි කිරීම සඳහා විධිවිධාන සලසමින් සහ දැනට ක්‍රියාත්මක 2019 අංක 01 දරන ග්‍රාහක සිම් කාඩ්පත් (ග්‍රාහක අනන්‍යතා මොඩියුල - SIM) ලියාපදිංචි කිරීමේ රෙගුලාසි යෝග්‍ය පරිදි සංශෝධනය කරමින් නව රෙගුලාසි හඳුන්වා දීම පිණිස ඩිජිටල් ආර්ථික අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**02. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ මාලදිවයින් ජනරජයේ ආරක්ෂක අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුම**

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ මාලදිවයින් ජනරජයේ ජාතික ආරක්ෂක බලකාය අතර අවබෝධතා ගිවිසුමක් වසර 05ක කාලසීමාවක් සඳහා 2012 වසරේ දී අත්සන් තබා ඇති අතර, 2018 වසරේ දී එම ගිවිසුම අලුත් කරනු ලැබ ඇත. එකී ගිවිසුමේ වලංගු කාලය 2023 වසරේ අවසන් වීමෙන් පසුව දෙපාර්ශ්වය අතර පවත්වනු ලැබ ඇති සාකච්ඡා මත පදනම් ව, පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, කාර්යමණ්ඩල හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ඒකාබද්ධ පර්යේෂණ හා අධ්‍යයන ක්‍රියාකාරකම් සංවිධානය කිරීම, ශාස්ත්‍රීය



163, කිරුළපන මාවත, කොළඹ 05, ශ්‍රී ලංකාව.
163, கிருலபன எவனியூ, கொழும்பு 05, இலங்கை.
163, Kirulapona Avenue, Colombo 05, Sri Lanka.
දු. දු | தொ T - (+94 11) 2515759
ෆැ | பெ F - (+94 11) 2514753
ඊ | மி E - dg@dgi.gov.lk
www.dgi.gov.lk
www.news.lk

ප්‍රකාශන හා වෙනත් තොරතුරු හුවමාරු කර ගැනීම සහ සංස්කෘතික හා මලල ක්‍රීඩා හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදී අරමුණු සහිතව සංශෝධිත නව ගිවිසුමක් අත්සන් කිරීම සඳහා එකඟතාවට පැමිණ තිබේ. ඒ අනුව, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සහ මාලදිවයින් ජනරජයේ ආරක්ෂක අමාත්‍යාංශය අතර යෝජිත අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස ආරක්ෂක අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 03. නියමු ව්‍යාපෘතියක් වශයෙන් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පහසුකම් සහිත වායුසමනය කරන ලද පත්ල පහත් නව බස් රථ 10ක් සේවයේ යෙදවීම

'ක්ලීන් ශ්‍රී ලංකා' ව්‍යාපෘතිය යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන යොදා ගනිමින් විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් සඳහා පහසුකම් සහිත වායුසමනය කරන ලද පත්ල පහත් බස් රථ සේවාවක් නියමු ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක කිරීමට තීරණය කරනු ලැබ ඇත. ඒ අනුව, ඒ සඳහා බස් රථ 10ක් මිල දී ගැනීම පිණිස වන ප්‍රසම්පාදනය මේ වන විට පිරිනමනු ලැබ ඇති අතර, 2026-03-15 දින වන විට එම බස් රථ මෙරටට ලැබීමට නියමිත ය. එකී බස් රථ ධාවනය සහ නඩත්තුව සඳහා අවශ්‍ය වන භෞතික යටිතල පහසුකම් හා ඩිජිටල් යටිතල පහසුකම් සැපයීමට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට හැකියාවක් නොමැති බව පෙනී ගොස් තිබේ. එබැවින්, බස් රථ ප්‍රවාහනය නවීකරණය සඳහා වන මූලික පියවරක් ලෙස නවීන සහ සුවපහසු, දියුණු තාක්ෂණයන් සහිත බස් රථ 100ක් කොළඹ නාගරික ප්‍රදේශය තුළ මගී ප්‍රවාහනය සඳහා යෙදවීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පිණිස, 2025-07-21 දින ගනු ලැබ ඇති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ ස්ථාපිත කරනු ලැබ ඇති ලංකා මෙට්‍රෝ ට්‍රාන්සිස්ට් (පුද්ගලික) සමාගම වෙත අදාළ බස් රථ 10 පවරා, ඒවායේ මෙහෙයුම් කටයුතු එම සමාගම යටතේ ක්‍රියාත්මක කිරීම පිණිස ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 04. 'ජාතික ඛනිජ ප්‍රතිපත්තිය' - 2026

'ජාතික ඛනිජ ප්‍රතිපත්තිය', 1999 වර්ෂයේදී ප්‍රථම වරට සකස් කරනු ලැබ ඇති අතර, ඛනිජ සම්පත් සම්බන්ධ යාවත්කාලීන දත්ත පද්ධතියක් සකස් කිරීම, ඛනිජ අපනයනය කිරීම සඳහා අගය එකතු කිරීම, ඛනිජ ආශ්‍රිත කර්මාන්තකරුවන් දිරි ගැන්වීම, ඛනිජ සම්පත් නිස්සාරණය හා පරිසරය තිරසර ලෙස කළමනාකරණය කිරීම සහ ඛනිජ සම්පත් නිස්සාරණයේදී මතු වන ඉඩම් අයිතිය සම්බන්ධ ගැටලු නිරාකරණය කිරීම වැනි කරුණු ආවරණය කරමින් 2023 වර්ෂයේදී සංශෝධනය කරනු ලැබ ඇත. එලෙස සංශෝධනය කරනු ලැබ ඇති ජාතික ඛනිජ ප්‍රතිපත්තිය,

වර්තමාන රජයේ 'පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්' ප්‍රතිපත්ති ප්‍රකාශයේ 'තිරසර සම්පත් භාවිතාවක් - උපරිම ප්‍රතිලාභ ජනනයක්' යන තේමාව යටතේ වන ප්‍රතිපත්ති මූලධර්මයන්ට අනුගතව නැවත යාවත්කාලීන කර තිබේ. ඒ අනුව, සකස් කරනු ලැබ ඇති 'ජාතික ඛනිජ ප්‍රතිපත්තිය - 2026' ක්‍රියාත්මක කිරීම පිණිස කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

05. **බදුල්ල ශික්ෂණ රෝහලේ දැනට ඉදිකිරීම් කටයුතු අත්හිටුවා ඇති වකුගඩු ප්‍රතිකාර ඒකකය සඳහා වන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අවසන් කර යෝජිත මහාචාර්ය ඒකක ස්ථාපනය කිරීම**

ඌව-වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සායනික පුහුණු මධ්‍යස්ථානය ලෙස තෝරා ගනු ලැබ ඇති බදුල්ල මහ රෝහල, ශික්ෂණ රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කොට ඇත. එම මහ රෝහලේ සායනික පුහුණු කාර්යයන් සඳහා අවශ්‍ය කරනු ලබන මහාචාර්ය ඒකකවලින් සහ ආශ්‍රිත ඉගැන්වීමේ පහසුකම්වලින් ආසන්න වශයෙන් 80%ක ප්‍රමාණයක් සපුරා ගැනීමේ අරමුණින් දැනට ඉදිකිරීම් කටයුතු අත්හිටුවා ඇති මහල් දහයකින් සමන්විත වකුගඩු ප්‍රතිකාර ඒකකයේ වැඩ කඩිනමින් නිම කිරීමට හැකි වන පරිදි ඒ සඳහා වන කොන්ත්‍රාත්තුව මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම වෙත ප්‍රදානය කිරීම පිණිස අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය වශයෙන් ගරු අග්‍රාමාත්‍යතුමිය; සහ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ ඒකාබද්ධ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

06. **උතුරු සහ නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක කිරීමට යෝජිත ඒකාබද්ධ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන**

2026 සිට 2031 දක්වා වන වසර 06ක කාලසීමාව සඳහා ලෝක බැංකු සමූහයේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක මූල්‍ය ප්‍රතිපාදන මෙරටට ලබා දීමට නියමිත අතර, ඉන් ඇමෙරිකානු ඩොලර් මිලියන 100ක් උතුරු සහ නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක කිරීමට යෝජිත ඒකාබද්ධ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන වෙනුවෙන් යොදා ගැනීමට සැලසුම් කර ඇත. එම වැඩසටහනේ පළමු අදියර යටතේ උතුරු සහ නැගෙනහිර පළාත්වල තෝරා ගත් ප්‍රදේශයන්හි කලාපීය නිෂ්පාදන විභවයන් (සංචාරක, ධීවර ආදී) ඉහළ නැංවීම, රැකියා බිහි කිරීම හෝ පවතින රැකියා අවස්ථා වැඩිදියුණු කිරීම, ව්‍යවසායයන් සඳහා සහාය වීම, පෞද්ගලික ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීම සහ ආයතනික සවිබල ගැන්වීම පිණිස යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා අවධානයක් යොමු කරන

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලෝක බැංකුව සමඟ සාකච්ඡා සම්මුති පැවැත්වීමටත්, යෝජිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළව සිය අමාත්‍යාංශය විසින් අනෙකුත් මූලික පියවර ගැනීමටත් ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

07. අන්තඃඅක්ෂි කාච සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය

ඇසේ සුද ඉවත් කිරීම හෝ මයෝපියාව සම්බන්ධ ප්‍රතිකාරවලදී ඇසට බද්ධ කිරීම සඳහා භාවිත කරනු ලබන අන්තඃඅක්ෂි කාච අයිතම වර්ග 35ක් මිල දී ගැනීම සඳහා ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවා ඇත. ඒ සඳහා ලංසුකරුවන් 05දෙනෙකු ලංසු ඉදිරිපත් කරනු ලැබ තිබේ. එම ලංසු ඇගයීමෙන් අනතුරුව ඉහළ මට්ටමේ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව සහ ප්‍රසම්පාදන අභියාචන මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති නිර්දේශ මත පදනම්ව, එම කාච අයිතම වර්ග 35 අතරින් අයිතම වර්ග 16ක් මිල දී ගැනීමේ ප්‍රසම්පාදනයන් අදාළ අයිතම වර්ග සඳහා සාරානුකූලව ප්‍රතිචාරාත්මක ලංසුකරුවන් වන Jayasuriya Associates, Kandy සහ Elshaddai Enterprises (Pvt)Ltd., Colombo වෙත ප්‍රදානය කිරීම පිණිස සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

08. ඊච්චලම්පත්තුව පොලිස් ස්ථානයේ පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ, ඊච්චලම්පත්තුව පොලිස් ස්ථානය දැනට කුඩා ගොඩනැගිලි කිහිපයක ඉතා දුෂ්කර අන්දමින් පවත්වාගෙන යනු ලබන අතර, ඒ හේතුවෙන් පොලිස් ස්ථානයේ රාජකාරි කරනු ලබන නිලධාරීන් මෙන්ම සේවය ලබා ගැනීම සඳහා පැමිණෙන මහජනතාව ද දැඩි අපහසුතාවන්ට පත් වී ඇත. එම තත්ත්වය මඟ හරවා ගැනීම පිණිස ඊච්චලම්පත්තුව පොලිස් ස්ථානය සඳහා නව පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර, ඒ සඳහා වන ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 75.94කි. ඒ අනුව, යෝජිත ව්‍යාපෘතිය 2026-2028 මධ්‍යකාලීන අයවැය රාමුව තුළ ක්‍රියාත්මක කිරීමටත්, ව්‍යාපෘතියේ උපදේශන සේවාවන් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙතින් ලබා ගැනීමටත් මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

09. **2026/2027 කාලසීමාව සඳහා සපුගස්කන්ද විදුලි බලාගාරය වෙත ලිහිසි තෙල් සැපයීමේ සහ බෙදාහැරීමේ ප්‍රසම්පාදනය**

සපුගස්කන්ද විදුලි බලාගාරයේ පවතින ඩීසල් එන්ජින් මඟින් බලගැන්වෙන ජනන යන්ත්‍ර කට්ටල 12 බලශක්ති ඉල්ලුම නොකඩවා ජනනය කරන බලාගාර (base load plants) ලෙස ක්‍රියාත්මක වේ. එම ජනන යන්ත්‍ර කට්ටල සඳහා අවශ්‍ය කරන ලිහිසි තෙල් සපයාගැනීම සහ බෙදා හැරීම සිදු කළ යුත්තේ අදාළ මෙහෙයුම් හා නඩත්තු අත්පොතෙහි දක්වා ඇති පරිදි මුල් උපකරණ නිෂ්පාදක විසින් නිර්දේශිත ලිහිසි තෙල් ලැයිස්තුවේ නියම කර ඇති කාණ්ඩ යටතේ ය. වත්මන් ලිහිසි තෙල් සැපයුම්කරුගේ කොන්ත්‍රාත් කාලසීමාව 2026-05-09 දිනෙන් අවසන් වීමට නියමිත අතර, ඉන් අනතුරුව වර්ෂයක කාලයක් සඳහා නව සැපයුම්කරුවකු තෝරා ගැනීම සඳහා ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම පිණිස බලශක්ති අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

10. **2023 අංක 1 දරන කොළඹ වරාය නගරය (සංවර්ධන පාලන) නියෝග සඳහා සංශෝධන ඉදිරිපත් කිරීම**

2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත ප්‍රකාරව වරාය නගරය තුළ ඇති ගොඩනැගිලි සහ ව්‍යුහයන්ගේ ලක්ෂණ නියාමනය කිරීම සඳහා 2023 අංක 1 දරන කොළඹ වරාය නගරය (සංවර්ධන පාලන) නියෝග 2023-06-02 දින ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එකී නියෝග මීට පෙර 2023-11-17 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් සංශෝධනය කරනු ලැබ තිබේ. මූලික වශයෙන් වෙරළ අවකාශය ඇතුළු භූමි ප්‍රදේශවලට ගැළපීම, සිරස් සංවර්ධනය සඳහා අවසර දී ඇති උපරිම උස ඉහළ නැංවීම සහ භාවිතයන් පිළිබඳ න්‍යාසයේ වර්ගීකරණය සම්බන්ධයෙන් එකී නියෝග තවදුරටත් සංශෝධනය කළ යුතු බවට කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ මත පදනම්ව 2025-12-29 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මඟින් එම නියෝග සංශෝධනය කිරීමට පියවර ගනු ලැබ ඇත. 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 71(4) වගන්තියේ විධිවිධාන පරිදි එකී සංශෝධිත නියෝගය අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම පිණිස මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

11. **ආර්ථික ප්‍රතිපත්ති සංවාදය පිළිබඳව ශ්‍රී ලංකාව සහ ජපානය අතර සහයෝගිතා ගිවිසුමට එළඹීම**

සංවර්ධන සහයෝගිතාව, වෙළෙඳාම සහ ආයෝජන යන ක්ෂේත්‍ර ආවරණය කරමින් ශ්‍රී ලංකාව සහ ජපානය දීර්ඝකාලීනව ආර්ථික සම්බන්ධතා පවත්වාගෙන ගොස් ඇත. ද්විපාර්ශ්වික ආර්ථික ගනුදෙනුවලට අමතරව, ශ්‍රී ලංකාව සහ ජපානය, දකුණු ආසියානු වෙළෙඳපොළවලට ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකාව උපායමාර්ගික අපනයන අභිමුඛ ආර්ථික කොරිඩෝවක් ලෙස ස්ථානගත කිරීම පිණිස උපායමාර්ග සොයා බැලීමට දෙරට අතර සාකච්ඡා ආරම්භ කරනු ලැබ තිබේ. ඒ අනුව, ශ්‍රී ලංකාව සහ ජපානය අතර විස්තීර්ණ සබඳතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් වෙළෙඳාම, ආයෝජනය සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ හා ශක්තිමත් කිරීමේ ප්‍රයත්නවල කොටසක් ලෙස ආර්ථික ප්‍රතිපත්ති සංවාදය පිළිබඳ සහයෝගිතා ගිවිසුමකට එළඹීම පිණිස වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

12. **මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම**

2025-05-26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සඳහා සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත සඳහා තවදුරටත් යෝජිත සංශෝධන හඳුන්වා දීම පිණිස 2026-01-26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, නීති කෙටුම්පත් සම්පාදක විසින් අවසන් පනත් කෙටුම්පත් සකස් කරනු ලැබ තිබේ. එකී පනත් කෙටුම්පත් රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

## 13. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම

ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවට ඉඩ ප්‍රස්ථාව සලසමින් බදු පද්ධතිය වැඩිදියුණු කිරීම පිණිස, යෝජිත බදු ප්‍රතිසංස්කරණ ඇතුළත් කරමින් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතට සංශෝධන හඳුන්වා දීම සඳහා 2025-05-19 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව, සංශෝධිත පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරනු ලැබ ඇති අතර, ඒ සඳහා නීතිපතිගේ නිෂ්කාශනය ලැබී ඇත. එකී පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, ඉන් අනතුරුව, අනුමැතිය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය වශයෙන් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

**********